2022.02.07

# කොවිඩ් පළමු රැල්ල සමයේ වැඩ කරන ජනතාවගෙන් 7%කට රැකියා අහිමි වෙලා

## සමීක්ෂණයකින් හෙළි වෙයි

**සුභාෂිණී සේනානායක**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් එළි දක්වන ලද නවතම සමීක්ෂණ වාර්තාවට අනුව 2020 කොවිඩ් පළමු රැල්ල විසින් මෙරට වැඩ කරන වැටුප් ලබන සේවකයන්ගෙන් සියයට 7කට සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ රැකියා අහිමිව ගිය බව වාර්තා කර ඇත.

ඔවුන් විසින් සිදු කරන ලද නිරීක්ෂණයන්ට අනුව මේ බව එම වාර්වේ දක්වා ඇති අතර එම වාර්තාවට අනුව කෘෂි අංශයේ ස්වයං රැකියාවන්හි නිරතවන්නන්ගෙන් 64.3%ක් සාමාන්‍ය පරිදි ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වී ඇති අතර එහෙත් 14.6% ක් වන පිරිසකට ඔවුන්ගේ නිෂ්පාදිත සාමාන්‍ය පරිදි අලෙවි කර ගැනීමට නොහැකි වී තිබේ.